# සිංහල

## 5 ශ්‍රේණිය



# පාඩම 14 - ‘සහ’ යොදා වැකි ලියමු.

## පියවර 1

- පහත වැකි කියවා අවබෝධ කර ගනිමු.

නංගී පලතුරු සලාද සාදයි.

අක්කා පලතුරු සලාද සාදයි.

නංගී සහ අක්කා පලතුරු සලාද සාදති.

❖ අන්න දැක්කද පුතේ , වාක්‍ය දෙකක් එකතු කරල ලියද්දී නාම පද දෙක මැදට ‘සහ’ යොදන අතර වාක්‍ය තුනක් එකතු කර ලියන විට පළමු නාම පද දෙක මැදට කොමාව යොදා අවසාන නාම පදයට පෙර ‘සහ’ යොදන බව

රුවනි විනීතව හැසිරෙයි.

ලවන් විනීතව හැසිරෙයි.

පවනි විනීතව හැසිරෙයි.

ලවන්, පවනි සහ රුවනි විනීතව හැසිරෙති.

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසීම :- උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

## පියවර 2

- දැන් ඔයත් මේ වැකි එකතු කර තනි වැකියක් සේ ලියන්න.

1. සීයා පොත් කියවයි.

   ආච්චි අම්මා පොත් කියවයි.

➢ ...........................................................................................................

2. මාමා දිනපතා උදෑසනින් ම වතුර වීදුරුවක් බොයි.

   නැන්දා  දිනපතා උදෑසනින් ම වතුර වීදුරුවක් බොයි.

   සීයා දිනපතා උදෑසනින් ම වතුර වීදුරුවක් බොයි.

➢ ...........................................................................................................

3. දනුක පුස්තකාලයට යයි.

   මනුති පුස්තකාලයට යයි.

➢ ...........................................................................................................

4. මාලක සෙල්ලම් කරයි.

   නාලක සෙල්ලම් කරයි.

   සාගර  සෙල්ලම් කරයි.

➢ ...........................................................................................................

5. නිලානි ගමට යයි.

   මිලානි ගමට යයි.

   දිලානි ගමට යයි.

➢ ...........................................................................................................

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසීම :-  උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

# පියවර 3

- පහත මිතුරන් දෙදෙනා කියන වැකි අපිත් කියවමු.




හ: හ: හා....... ඔය වැකි මෙහෙම කියන එක වඩාත් ලේසියි.




- **දැන් අපි වැකි 3 ක් එකතුකර කියවා බලමු.**

1. නංගී කතන්දරවලට සවන් දෙයි.

   මල්ලී කතන්දරවලට සවන් දෙයි.

   අක්කා කතන්දරවලට සවන් දෙයි.

   නංගී, මල්ලී හා අක්කා කතන්දරවලට සවන් දෙති .

වැකි 3 ක් එකතු කළ විට මුල් නාමපද කොමාවෙන් වෙන් කරයි.

තුන්වන නාමපදයට පෙර ‘හා’ යොදයි.

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසීම :-  උදාර ජයවික්‍රම, හ/තෙළඹුයාය ක.වි. , හකුරුවෙල.

- දැන් පහත වැකි 'හා' යොදා එකතුකර ලියමු.

1. නැන්දා තල අලුවා සාදයි.

   ආච්චි අම්මා තල අලුවා සාදයි.

   පුංචි අම්මා තල අලුවා සාදයි.

.............................................................................................................................

.............................................................................................................................

2. නිමල් සෙල්ලම් කරයි.

   තරිඳු සෙල්ලම් කරයි.

   කවිඳු සෙල්ලම් කරයි.

.............................................................................................................................

.............................................................................................................................

3. සීයා බෙහෙත් පැළෑටි සොයයි.

   නැන්දා බෙහෙත් පැළෑටි සොයයි.

   මාමා බෙහෙත් පැළෑටි සොයයි.

.............................................................................................................................

............................................................................................................................

